10 ශ්‍රේණිය | දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | පළමු වාර පරීක්ෂණය 2019 | ඉස්ලාම්

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (2) | 02. (4) | 03. (4) | 04. (4) | 05. (1) | 06. (1) | 07. (1) | 08. (4) | 09. (2) | 10. (1) |
| 11. (1) | 12. (4) | 13. (2) | 14. (1) | 15. (2) | 16. (3) | 17. (2) | 18. (3) | 19. (1) | 20. (4) |
| 21. (3) | 22. (3) | 23. (2) | 24. (2) | 25. (3) | 26. (1) | 27. (1) | 28. (3) | 29. (2) | 30. (4) |
| 31. (4) | 32. (4) | 33. (2) | 34. (3) | 35. (2) | 36. (1) | 37. (4) | 38. (2) | 39. (3) | 40. (3) |

(ලකුණු 1 x 40 = 40)

## පිළිතුරු පත්‍රය - II පත්‍රය

(01) (1) සූරා ෆාතිහා, අත්තහියියාත්, සලවාත්, පළවෙනි සලාම්

(2) සාමාන්‍ය නජීස් උදා:- මළ, මුත්‍රා, ලේ .....
මෘදු නජීස් උදා:- වයස අවු. 2 ට අඩු මව්කිරි පමණක් ආහාරයට ගන්නා පිරිමි දරුවාගේ මුත්‍රා
දැඩි නජීස් උදා:- බල්ලා සහ ඌරාගේ කෙළ, දහඩිය, මළ මුත්‍රා ......

(3) මලක්වරු, ජින්වරු, ෂෙතාන්වරු, රූහ් .....

(4) ජබරියියා, මුර්ජියියා, මුඃතසිලා, කද්රියියා, ෂිආ, කවාරිජ්....

(5) නෆ්සුල් අම්මාරා බිස්සූඃ, නෆ්සුල්ලව්වාමා, නෆ්සුල් මුත්මඉන්නා

(6) කබ්රු, බඃස්, හිසාබ්, මීසාන්, සිරාත්.

(7) ජලය නොමැති අවස්ථාව, රෝගී තත්වයේ ජලය භාවිත කිරීමට නොහැකි අවස්ථාව, පානය කිරීමට පමණක් ජලය තිබෙන අවස්ථාව.

(8) අත්තහාරත් = පිරිසිදුකම, අන්නජාසත් = අපවිත්‍රතාවය

(9) බල්ලා සහ ඌරා

(10) ඉඛ්ලාස්, ඉවසීම.

(ල. 2x10 = 20)

(02) (1)
- මූලික ඉබාදතයන්, ඇදහිළි වතාවත්
- දෛනික කටයුතු

(2)
- සිත පාලනය කර දේව බිය ඇති කිරීම.
- අල්ලාහ් හා සමීපවීම වර්ධනය කර ගැනීම.
- පවෙන් මිදී ජීවත් වීමට පුහුණුව ලැබීම.
- පරිත්‍යාගශීලී, ඉවසීම, අන්අයගේ සුබසෙත රැකීම යනාදි ගුණාංග වර්ධනය කිරීම.
- දේව තෘප්තිය ලබා ස්වර්ගස්ථ වීමට මග පෑදීම.

(3)
- ඉස්ලාමීය පස්මහ වගකීම් හි මූලික ඉබාදතයක් වන්නේ සලාතයයි.
- ඉස්ලාම් සලාතය මුඃමින්වරයාගේ සලකුණ බවද, මුඃමින්වරයා හා කාෆිර්වරයා අතර වෙනස සලාතය බවද දක්වයි.
- ෆර්ලු අයින් වූ ඉබාදතයකි.
- 'සලාතය පිහිටුවන්න. නියතවශයෙන්ම සලාතය වනාහි මුඃමින්වරුන් හට කාලය නියම කරන ලද වගකීමකි' (අල්කුර්ආන්)
- 'සලාතය ඉස්ලාම් හි පදනම බවද, ප්‍රධාන කුළුණ බවද 'නබිතුමා ප්‍රකාශකර සිටියි.
- සලාතය ප්‍රධාන වගකීම වශයෙන් පිළිනොගන්නා අයහට නබිතුමාණෝ දැඩිව අවවාද කර සිටියි.

(ල. 2 + 3 + 5 = 10)

(03) (1) සකාත්, සදකා, උළුහියියා

(2)
- කලීමා තව්හීද් - ලාඉලාහ.... ශෙයිඉන් කදීර්
- අල්ලාහුම්ම අජිර්නී මිනන්නාර්
- අල්ලාහුම්ම ඉන්නී අස්අලුක ඉල්මන් නාෆිආ, වරිස්කන් තයියිබා, වඅමලන් මුතකබ්බලා

(3)
- ෂරීආවේ අනුමැතිය
- පිරිසිදු චේතනාව
- මූලික වතාවත්වලට පටහැනි නොවීම.
- නිරවද්‍යව, පිළිවෙලින් ඉටුකිරීම
- ෂරීආ සීමාවන් ඉක්මවා නොයෑම.

(ල. 2 + 3 + 5 = 10)

(04) (1) සුන්නත් සලාත් වර්ග, සව්ම් වර්ග, රෝගීන් බැහැදැකීම, දික්ර්, සලාම් පැවසීම යනාදි

(2) දෙපා, දෙදණහිස්, අත්ල දෙක, නළල.

(3) ඉලාහියියාත්, නුබුව්වාත්, රූහානියියාත්, සම්ඉයියාත්,
රූහානියියාත් :- භෞතික ලෝකයටත්, පංචේන්ද්‍රියන්ටත් හසු නොවන මලාඉකාවරු, ජින්වරු, ෂෙතාන්වරු, රූහ් යනාදි මෙම කොටසෙහි අඩංගු වේ.

(ල. 2 + 3 + 5 = 10)

(05) (1)
- ඉමාරත් - පොළොව සශ්‍රීක කිරීම.
- කිලාෆත් - අල්ලාග්ගේ නියෝජිතයා වශයෙන් මෙළොව පාලනය කිරීම.

(2)
- බල්ලා ඌරා යනාදීන්ගේ මළ පහ මුත්‍රා, කෙළ, දහඩිය, ලේ යනාදි දැඩි නජීස් ගණයට අඩංගු වේ.

- මෙම නජීසයන් ශරීරයේ හෝ ඇඳුම්වල තැවරුනහොත් මුලින් ම එය ඉවත් කළ යුතුයි.
- එහි රසය, පැහැය, සුවඳ ඉවත්වන තෙක් සේදිය යුතුයි.
- සත් වතාවක් ජලය වත්කර සෝදන අතර, මුල් වතාවකදී පස් මිශ්‍රණයක් යොදාගත යුතුයි.
- හොඳින් සෝදා නිම කළ යුතුයි.

(3)
- මුනිච්ඡාව, උඩඟුබව, ඊර්ෂ්‍යාව යනාදි පහත් ගුණයන්ගෙන් මිදීම.
- ෆර්ලු කටයුතු නිසි අයුරින් ඉටු කිරීම.
- නෆිල් කටයුතු වල නියැලීම.
- දික්ර් කිරීම.
- කුර්ආන් පාරායනය
- තව්බා
- ඉස්තිඃෆාර්

(ල. 2 + 3 + 5 = 10)

(06) (1) ''තවද ජින්වරුන් සහ මිනිසුන්ව මාව නැමදීම පිණිස හැර නොවැව්වෙමි.''

(2) මූසා (අලෛ) → තව්රාත් → අබරානි (හීබ්රූ) බසින්
දාවූද් (අලෛ) සබූර් යූනානී (ග්‍රීක) බසින්
ඊසා (අලෛ) ඉන්ජීල් සුරියානි (සිරියානු) බසින්

(3)
- 'නියත වශයෙන් අල්ලාහ් පිරිසිදුවන්තයින්ව ප්‍රිය කරයි. (අල්කුර්ආන්)
- '(නබිවරයාණනි) ඔබගේ වස්ත්‍ර පිරිසිදු කරගන්න. (කුර්ආන්)
- පිරිසිදුකම ඊමානයේ හරි අඩකි. (අල්හදීස්)

(ල. 2 + 3 + 5 = 10)

(07) (1) <u>තස්කියතුන් නෆ්ස්</u> :-
- භාෂාමය අරුත - චිත්ත පාරිශුද්ධිය
- පරිභාෂික අරුත - මුස්ලිම්වරයෙකු අල්ලාහ්ට ආදේශ කිරීමෙන් ද දුර්ගුණාංගයන්ගෙන් ද තම සිත සහ කය ආරක්ෂා කිරීම.

සිතෙහි තත්ත්වයන් තුන
- නෆ්සුල් අම්මාරා බිස්සුඃ
- නෆ්සුල්ලව්වාමා
- නෆ්සුල් මුත්මඉන්නා

තස්කියාවෙහි වැදගත්කම
- දෙලෝ ජයග්‍රහණය උදෙසා චිත්තපාරිශුද්ධිය අති වැදගත් වේ.
- නියත වශයෙන් යමෙක් එය (සිත) පවිත්‍රව තැබුවේද ඔහු ජයග්‍රාහිකයෙකී. යමෙක් එය කෙළසයිද ඔහු නියත වශයෙන්ම අලාභයට පත්වූවකි.
- නියත වශයෙන් ශරීරයේ මස්කැබැල්ලක් ඇත. එය යහපත් වුවහොත් මුළු ශරීරයම යහපත් වේ. එය කෙළෙසුනහොත් මුළු ශරීරයම කෙළෙසෙයි. දැනගන්න එය හදවත වේ. (අල්හදීස්)

(2) <u>පිරිසිදුකමේ වැදගත්කම</u>
- ඉස්ලාම් සියලුම මුස්ලිම්වරුන් හට පිරිසිදුකම රැකගැනීමේ වගකීම තදින්ම පවරා තිබේ.
- පිරිසිදුකම රැක ගැනීම ආනිසංස ලබාදෙන ඉබාදතයකි.
- නියත වශයෙන් අල්ලාහ් පිරිසිදුවන්තයින්ව ප්‍රිය කරයි.
- 'පිරිසිදුකම ඊමානයේ හරි අඩකි.' වහී
- ඉස්ලාමයේ වගකීම් ඉටු කිරීමට පිරිසිදුකම රැකගැනීම අනිවාර්යයි.
- පවිත්‍රතාවයෙන් තොර කිසිදු නැමදුමක් අල්ලාහ් පිළිනොගනීයි.
- මුස්ලිම්වරයා බාහිර, අභ්‍යන්තර දෙකෙහි පිරිසිදුකම රැකිය යුතුයි.

(3) <u>රිසාලත්හි අවශ්‍යතාවය</u>
- රිසාලත් යනු අල්ලාහ් විසින් ප්‍රදානය කරනු ලැබූ මඟපෙන්වීම්, දේශනා යනාදීන් වේ. මෙය වක්තෘත්වයට අඩංගු ය.
- මිනිසා ඍජු මාර්ගයට යොමු වීම සඳහා රිසාලත් අවශ්‍ය වේ.
- අල්ලාහ්ගේ කරුණා මහිමයට ලක්වූවන් රිසාලතයට අවනත වන මානසිකත්වය හිමි කර ගනීයි.
- උසස් ගුණාංගයන් සහ විනයානුකූල කරුණු දැනගැනීමටද ඒවා රැකීමටද රිසාලත් අවශ්‍ය වේ.
- මිනිසා මවන ලද අරමුණු ද මෙමඟින් පැහැදිලි කර ඇත.
- පරමාන්ත ජීවිතය පිළිබඳ දැනුවත්වීමටද මෙය අවශ්‍ය වේ.
- මිනිස් සමාජය නොබෙදී එක්සේසත්වීමටද රිසාලත් අවශ්‍ය වේ.

(4) <u>අකීදා</u> - මෙහි භාෂාමය අරුත විශ්වාස සංකල්ප හා පදනම් වේ.
- ඉස්ලාමීය ව්‍යවහාරයෙන් - ස්ථිර හා අවසන් වූ න්‍යායන් අනුව ගොඩනගන ලද ඉස්ලාමීය විශ්වාසයයි.
- "අකීදාවෙහි" බහුවචනය "අකා ඉද්"
- අල්ලාහ්ගේ දූතයන් සියලුදෙනා එකම අකීදාව දේශනා කර තිබීම. (කුර්ආන් 42:13)
- ඉස්ලාමීය විශ්වාසයන් ආශ්‍රිත කරුණු ගොනුකර පහදා දෙන කලාව 'ඉල්මුල් අකීදා' වේ.
- අල්කුර්අන් සහ සුන්නාත් ඉල්මුල් අකීදාවේ පදනම වේ.
- විශ්වාස කළ යුතු කරුණු හය මෙහි අඩංගු වේ.

(ල. 5 + 5 = 10)